# ඊනියා යුද්ධය, ශ්‍රී ල නි ප යෝජනා හා ඒකීය රාජ්‍යය

මෙරට යුද්ධයක් නිර්මාණය කළෝ ඊනියා ප්‍රබුද්ධයෝ ය. ඔවුන් අතර විශ්වවිද්‍යාලයීය ආචාර්යවරු, ජනමාධ්‍යවේදීහු, කලාකරුවෝ ආදීහු වෙති. ප්‍රධාන ඉංගිරිසි පුවත්පතක කතුවරයා ලෙස සේවයකළ එක්තරා තැනැත්තෙක් ඊළාම් යුද්ධය එක, දෙක ආදී වශයෙන් ඒ ඊනියා යුද්ධ නම් කෙළේ ය. සමහරවිට ඔහු හඳුන්වාදුන් එකම අළුත් ප්‍රකාශය ඒ වීමට හැකි ය. කෙසේ වෙතත් අප අවුරුදු ගණනාවක් තිස්සේ කියන දෙයක් දැන් ආණ්ඩුව ද කීම ගැන අපි සතුටු වෙමු. මෙහි ඇත්තේ යුද්ධයක් නොව ආණ්ඩුවට විරුද්ධව ආයුධගත් ත්‍රස්තවාදී සංවිධානයකට එරෙහිව කෙරෙන හමුදා මෙහෙයුමක් පමණකි. මෙය යුද්ධයක් නම් ජ වි පෙරමුණට එරෙහිව එකල කෙරුණු මෙහෙයුම් ද යුද්ධ විය යුතු ය. දැන් දැන් හමුදා මෙහෙයුම් යම් සාර්ථකත්වයක් ඇතිව සැලසුමකට අනුව කෙරීගෙන යයි. නාවික හමුදාව කොටි ත්‍රස්තවාදීන්ට ආයුධ ගෙනෙන නැව් විනාශකිරීමට සමත් වෙයි. ගුවන් හමුදාව වෙනදාට වඩා හොඳින් අහසේ සිට පහර දෙයි. පාබල හමුදාව හා පොලිස් විශේෂ කාර්ය බලකාය කොටි කඳවුරු විනාශකිරීමට සමත්වෙයි. ඒ අතර පොලීසිය සිවිල් ආරක්‍ෂාව පිළිබඳ කටයුතු සාර්ථකව කරගෙන යයි. මේ සියල්ලට ම දේශපාලන නායකත්වයක් තිබීම අනිවාර්ය බව අමුතුවෙන් කිවයුතු නො වෙයි.

එහෙත් ප්‍රශ්නය වන්නේ මේ කටයුතු දිගින් දිගට ම කළ හැකි ද යන්න ය. කොටි ත්‍රස්තවාදීන් ආයුධ මිළ දී ගන්නේ ඔවුන් දෙමළ ජනයාගෙන් බලයෙන්, රැවටීමෙන් හා වෙනත් ක්‍රමවලින් ලබාගන්නා මුදලින් පමණක් යැයි සිතීමට නො හැකි ය. ඩොලර් බිලියන ගණනින් වූ ආයුධ ලබාගැනීමේ දී බටහිර රටවල් ඔවුන්ට කෙතරම් දුරට ආධාරකෙළේ දැයි අපි නො දනිමු. එහෙත් කොටි හුදෙක් දෙමළ ජනයා අතින් පමණක් නඩත්තු වූ සංවිධානයක් විය නො හැකි ය. කොටි සංවිධානය පරාජය කළ නොහැකි බව මෙරට ඊනියා ප්‍රබුද්ධයන් කීවේ ඔවුන්ගේ ප්‍රබුද්ධ මොළයෙන් කල්පනා කර නොව බටහිරයන් ඔවුන් ලවා ඒ කියවූ බැවිනි. ගරිල්ලා සටන් පිළිබඳ මහප්‍රාණ කියවූ මොවුහු මහා ගරිල්ලා වූ චේ ගෙවාරාට බොලිවියාවේ දී සිදු වූ දේ අමතක කරති. පිටරට හමුදාවකට වියට්නාමයේ දී මෙන් ගරිල්ලා සටන් පරාජයකළ නොහැකි වුව ද තම රටේ දී හමුදාවකට ගරිල්ලා සටන් පරාජය කිරීම අසීරු කාර්යයක් නො වේ. කොටි සංවිධානය අවුරුදු තිහක් පමණ පවත්වාගෙන ගියේ බටහිරයන් හා ඉන්දියාව විසින් යැයි අපි නිර්භයව කියමු. බටහිරයන්ගේ හා ඉන්දියාවේ බලපෑම්වලට මෙරට දේශපාලන නායකත්වය විටින් විට හිස නොනමන්නට ප්‍රභාකරන් වැළලූ තැන මේ වන විට විශාල තල්ගසක් දැකිය හැකිව තිබුණි.

අනෙක් අතට අප කලින් ද කියා ඇති පරිදි යුරෝපයේ යුද්ධය නැවැත්වූයේ හිට්ලර් පරාජය කරනු ලැබුයේ චර්චිල් හා ස්ටැලින් විසින් මිස යුද විරෝධී බ්‍රෙෂ්ට්ලා විසින් නො වේ. මෙරට සැබෑ කලාකරුවන්වීමට නොහැකි කාඩ්බෝඩ් බ්‍රෙෂ්ට්ලා අඩුම තරමින් ඊනියා මානව හිතවාදීන් වීමට බටහිරයන්ගේ හා වෙනත් සිංහල විරෝධීන්ගේ මුදලින් ඊනියා යුද්ධයට විරුද්ධව කෑ කෝ ගසති. විශ්වවිද්‍යාලවල ගැටුම් පවතින විට පැත්ත පළාතක නොඑන රාජ්‍ය නොවන සංවිධානවලින් මුදල් ලබන ගැටුම් නිරාකරණය පිළිබඳ ඇදුරෝ ගැටුම් නිරාකරණය ගැන හමුදාවට බයිලා කියති. ජනමාධ්‍ය ඇදුරෝ ජනමාධ්‍යයෙහි ව්‍යාජ වීරයන් වීමට ඊනියා යුද්ධයට විරුද්ධව ප්‍රකාශ නිකුත් කරති. මොවුන් දන්නා යුද්ධයක් හෝ සාමයක් හෝ නැත. අද සමස්ත අධ්‍යාපනය සිසාරා පවතින බටහිර ආධිපත්‍යය නොදකින මොවුහු තම බටහිර ස්වාමිවරුන්ගේ මත වපුරවමින් විශ්වවිද්‍යාල බාල්දුකරති.

අද ද බටහිරයන් කොටි මුළුමනින් ම පරාජයකිරීමට ඉඩ නොදෙනු ඇත. කොටි පරාජයකිරීමට සිතන්නන් සිහින දකින බව ඔවුන් කියන්නේ එබැවිනි. අපට බටහිරයන් ගැන කිසිම විශ්වාසයක් නැත. කොටින්ට එක් පැත්තකින් ආයුධ ගැනීමට මුදල් දී අනෙක් පැත්තෙන් ආයුධ නැව් විනාශකිරීම සඳහා ආණ්ඩුවට අදාළ තොරතුරු දීමට වුව ද ඔවුන්ට හැකි ය. අද ද ඔවුහු යම් ප්‍රමාණයකට කොටි ත්‍රස්තවාදීන් ආරක්‍ෂාකරති. ඒ කොටි නැතිව ෆෙඩරල් රාජ්‍යයක් ලබාගැනීමට ඔවුන්ට නොහැකි බැවිනි. යම් අයුරකින් ෆෙඩරල් රාජ්‍යයක් ලබාගෙන සිංහලයන්ට උතුරු හා නැගෙනහිර පළාත් අහිමිකිරීමට හැකිවුවහොත් බටහිරයන් කොටි මුළුමනින් ම පැරදවීමට ඉඩදෙනු ඇත. මෙරට නැගෙනහිර පළාත ගැන බොරු ඉතිහාස ලියන්නන් හා දෙමළ බෞද්ධයන් ගැන සුරංගනා කතා ලියන්නන් එසේ කරන්නේ අවසාන වශයෙන් බටහිරයන්ගේ අවශ්‍යතා අනුව උතුරු හා නැගෙනහිර පළාත් සිංහලයන්ට අහිමිකිරීමට ය. අපට අවශ්‍ය වන්නේ බටහිරයන්ගේ අනුග්‍රහයෙන් ගෙතූ බොරුවක් මත පදනම් වී ඉල්ලන ෆෙඩරල් රාජ්‍යය ලබානොදී ම කොටි

© Prof. Nalin De Silva

පරාජයකිරීමට ය. එහෙත් බටහිරයෝ ආණ්ඩුවට ඒ සඳහා ඉඩ දෙත් ද? ශ්‍රී ල නි ප ඉදිරිපත්කරන යෝජනා දෙස අද වැඩියෙන් ම බලාසිටින්නෝ බටහිරයෝ ය.

මේ අතර  සර්ව පාක්ෂික නියෝජිත කමිටුවේ සභාපති තිස්ස විතාරණ ඒ ඊනියා පදවිය ද තම ඇමති ධුරය ද බංකොලොත් සමසමාජ පක්ෂයේ ෆෙඩරල් ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීමට යොදාගනියි. සර්ව පාක්ෂික නියෝජිත කමිටුවේ සභාපති ධුරය යනු රැස්වීම්වල මුලාසනය දැරීම හැර වෙනත් වගකීමක් හෝ බලයක් ඇති තනතුරක් නොවේ. අද තිස්ස විතාරණ ඊනියා විද්වත් කමිටුවේ බහුතරයේ අදහස් වැඩිවශයෙන් රැගත් යෝජනාවලියක් ඉදිරිපත්කර එය රට වටේ ගෙන යයි. ඔහු අනෙක් පක්ෂවලට කියන්නේ තම යෝජනාවලට සංශෝධන පමණක් ඉදිරිපත්කරන ලෙස ය. එහි තේරුම අනෙක් පක්ෂ ඔහුගේ බංකොළොත් පක්ෂයේ ප්‍රතිපත්ති රාමුව පිළිගෙන ඒ රාමුව ඇතුළත සංශෝධන ඉදිරිපත් කලයුතු බව ය. ඔහුට වෙනත් යෝජනා අවශ්‍ය නො වේ. ඡන්ද විසිපන්දාහක් ලබාගත නොහැකි පක්ෂයක නායකයා ජාතික ලැයිස්තුවෙන් මන්ත්‍රී ධුරයක් ලබාගෙන මහජන මතයට පටහැනිව ෆෙඩරල් ක්‍රමයක් ඉදිරිපත්කරන්නේ මෙරට ජනතාවගේ අවශ්‍යතාවකට නම් නො වෙයි. වාසනාවකට මහජන එක්සත් පෙරමුණ තිස්ස විතාරණ යෝජනා ඒ ඉදිරිපත් කළ දිනවලම මුළුමනින් ම ප්‍රතික්ෂෙප කෙළේ ය. ඔහුගේ යෝජනාවලට සංශෝධන ඉදිරිපත්කිරීම ම ෆෙඩරල් ආකෘතිය පිළිගැනීමකි. තිස්ස විතාරණ මේ අතර පසුගිය දා පුවත්පතකට කියා තිබුනේ අද යාපනයට යැමට කොට් පාලනයෙහි පවතින ප්‍රදේශ හරහා යා යුතු බවත් එබැවින් රට දැනටමත් බෙදී ඇති බවත් ය. කොටින්ගේ පාලනයක් අද ලංකාවේ කොහේවත් නැත. කොට් පාලනයක් ඇතැයි කියන ප්‍රදේශවල ද ජනතාවට කෑම බීම ආදිය ලැබෙන්නේ ලංකාණ්ඩුවේ පිහිටෙනි. යම් හෙයකින් කොට් පාලනයකට යම් ප්‍රදේශයක් යටත් යැයි සිතමු. එවිට ආණ්ඩුව කළ යුත්තේ රට දැනටමත් බෙදී ඇතැයි කියමින් ෆෙඩරල් දීම ද? එසේත් නැතහොත් කොට් යටතේ තිබෙන්නේ යැයි කියන ප්‍රදේශ මුදාගැනීම ද? තිස්ස විතාරණ යනු පුදුම ඇමතියෙකි. ඔහුට ඒ ප්‍රදේශ මුදාගැනීමට අවශ්‍ය නැත. ඔහුට අවශ්‍ය ෆෙඩරල් දීමට ය. ජාතික ලැයිස්තුවෙන් පත් වූ ඡන්ද නැති මේ ඇමති ආණ්ඩුවටත් රටටත් බරකි. ඔහු ජනවරමට පිටුපා ඔහුගේ අබල දුබල පක්ෂයේ මතය තම "තනතුරු" උපයෝගී කරගනිමින් ජනතාවට බලයෙන් පැටවීමට උත්සාහ කරයි. ජනාධිපතිතුමා මොහුගේ ඇමති බර ඉවත් කළත් සමසමාජ පක්ෂයට අඩුම තරමින් තම පක්ෂ කාර්යාලය අසල ලිප්ටන්ගේ නමින් තවමත් ඇති වටරවුමේ පිකට්ටුවක්වත් සංවිධානය  කළ නො හැකි ය.

ශ්‍රි ල නි පක්ෂය තම යෝජනා ඉදිරිපත් කළයුතුව ඇත්තේ මෙවන් පසුබිමක ය. ඒ පක්ෂයට කෙසේවත් ජනවරමින් පිටගොස් ඒකීය රාජ්‍යයට පිටුපෑමට නො හැකි ය. ඒ අතර බටහිරයෝ ඒකීය විසඳුමක් මත පදනම් වී කොට් පරාජයකිරීමට එරෙහිව බලපෑම් කරති. කළයුත්තේ මේ බලපෑම් ගැන පැහැදිලි ව කියා එයට මුහුණදීමට ජනතාව සූදානම්කිරීම ය. ඊනියා මානව අයිතිවාසිකම්වලට මුවා වී ආර්ථික තහංචි පැනෙව්ව ද එයට මුහුණ දීමට තවත් ථෙරවාදී රටක් වූ මියන්මාරයෙන් ඉගෙනගත යුතු ය. අපට ඒකීය සංකල්පය යුරෝපයෙන් ලැබුණක් නො වෙයි. මෙරට පැවතියේ එක්සේසත් රාජ්‍යයකි. ඇතැම් බටහිර ගැති උගතුන්ගේ මතයට පටහැණිව රුහුණු මායා පිහිටි යනු ෆෙඩරල් හෙවත් සන්ධීය ප්‍රාන්ත නො වේ. (බටහිර ගැති උගතා යනු ලිබරල් ධනේශ්වර උගතා පමණක් නො වෙයි. බටහිර ක්‍රිස්තියානි නූතනත්වයේ මාක්ස්වාදී, පශ්චාත් මාක්ස්වාදී ආදී සියල්ලෝ ද බටහිර ගැති උගත්තු වෙති.) ඒ ප්‍රාන්ත කරවීම (පරිපාලනය) සඳහා රජුගේ නියෝජිතයෝ ඈපා මාපා යුවරජු ආදී වශයෙන් ඒ ප්‍රාන්තවල කටයුතු කළහ. එදා පැවති එක්සේසත් රාජ්‍යය යනු අද අර්ථයෙන් නම් ඒකීය රාජ්‍යයක් වෙයි. එහි පැවතියේ එක් ව්‍යවස්ථාදායකයකි. අද ද අපට එක්සේසත් රාජ්‍යයක් ඇතිකරගත හැකි ය. එහි තිබිය යුත්තේ එක් ව්‍යවස්ථාදායකයක් පමණකි. එනම් අද වචනවලින් නම් පාර්ලිමේන්තුව පමණකි. පළාත් සභා අහොසි කළ යුතු ය. පළාත් සභා අප මත බලයෙන් පැටවූයේ ඉන්දියාව ය. පාර්ලිමේන්තුවේ ඒ ඒ දිස්ත්‍රික්කවලින් පත්වන මන්ත්‍රීවරුන්ගේ (ජාතික ලැයිස්තු මන්ත්‍රීවරුන් නොවන) කාරක සභා පිහිටුවිය හැකි ය. ඒ කාරක සභාවලට ද යම් ක්ෂෙත්‍ර සම්බන්ධයෙන් බලතල අයත් වෙයි. ඒ ඒ දිස්ත්‍රික්කයේ ඒ ක්ෂෙත්‍ර සම්බන්ධ සංවර්ධන කටයුතුවල දී අදාළ කාරක සභාවේ අනුමැතිය ද ලබාගත යුතු ය. කාරක සභාවකට සමස්ත පාර්ලිමේන්තුවේ තීරණයක් වුව ද තුන්වරක් යනතෙක් ප්‍රතික්ෂෙප කළහැකි ය. එහෙත් ඉන්පසු පාර්ලිමේන්තුවට යම් විශේෂ වැඩි ඡන්දයක් මගින් තම තීරණය ක්‍රියාත්මක කළ හැකි ය. උත්තර මන්ත්‍රී මණ්ඩල, පළාත් සභා ආදී ව්‍යවස්ථාදායක කිහිපයක් වෙනුවට එක් ව්‍යවස්ථාදායකයක ද්විත්ව ස්වභාවයක් මෙහි දී යෝජනා කෙරෙයි. ඒ අතර පරිපාලනය ඈපාවරුන් යටතේ හැකිතාක් විමධ්‍යගත කළ හැකි ය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva